අ.පො.ස උසස් පෙළ

# ගිණුම්කරණය






ගිණුම්කරණ තොරතුරු භාවිත කරන විවිධ පාර්ශ්වයන්

## නිපුණතාව 1.0

ගිණුම්කරණය හා එහි අවශ්‍යතාවය විග්‍රහ කරයි.මෙම නිපුණතාවය යටතේ පහත නිපුණතා මට්ටම් සාකච්ඡා කෙරේ.

## නිපුණතා මට්ටම 1.1

ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු වැදගත් වන ආකාරය විස්තර කරයි.

## නිපුණතා මට්ටම 1.2

ගිණුම්කරණ පරිසර සාධක වල වෙනස් වීම මත ගිණුම්කරණයේ වෙනස්වීම හා ප්‍රවනතා සිදුවන ආකාරය විග්‍රහ කරයි..

## නිපුණතා මට්ටම 1.3

ගිණුම්කරණය ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි.


අන්තර්ගතය - ඩී.එම්.එස් දිසානායක -කු/මලියදේව.වි -කුරුණෑගල
යූ.බී.ධර්මදාස - අ/තඹුත්තේගම ම.ම.වි- තඹුත්තේගම
යූ.අතුල ඒකනායක -මා /ශාන්ත තෝමස් ජාතික පාසල- මාතලේ
සැකසුම - ඩී.ඒ.ඩී චින්තක උදය කුමාර- ර/ශ්‍රී ඥාණානන්ද ම.වි -කාමරංගාපිටිය,පැල්මඩුල්ල

Copyright © e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 1.1

ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු වැදගත් වන ආකාරය විස්තර කරයි.

### මූලික පද හා සංකල්ප





Copyright © e-thaksalawa.moe.gov.lk

## 1.1.සටහන්

### ගිණුම්කරණය හැඳින්වීම

හිඟ සම්පත් වලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට නම් ඒවා පරිහරණය කිරීම පිළිබඳ වාර්තා තබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

මෙලෙස හිඟ සම්පත් පරිහරණය පිළිබඳ වාර්තා තබා ගැනීමේ ක්‍රම වේදයක් ලෙස බිහිවී විකාශනය වූ ගිණුම්කරණය වර්තමානය වන විට සමාජ ආර්ථික අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා තොරතුරු ලබාදෙන පද්ධතියක් ලෙස සංවර්ධනය වී ඇත.

විවිධ ආයතන විසින් ගිණුම්කරණය පිළිබඳව පහත නිර්වචනයන් ඉදිරිපත් කර ඇත.

- ඇමරිකානු ගිණුම්කරණ සංගමය (American Accounting Association)

" තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශව වලට විනිශ්චයක් කිරීමටත් තීරණ ගැනීමටත් හැකිවන අයුරු ආර්ථික තොරතුරු හඳුනා ගැනීමේ,මැනීමේ සහ සංනිවේදනය කිරීමේ ක්‍රියාවලිය ගිණුම්කරනයයි."

- ඇමරිකානු පොදු සහතික ලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (American Institute of Certified Public Accountants.)

" වාර්තාකරණ ඒකකයක යටත් පිරිසෙයින් අර්ධ වශයෙන්වත් මූල්‍යමය ස්වරූපයක් ගන්නා ගනුදෙනු හා සිදුවීම් සුවිශේෂී ආකාරයට මුදල් මාධ්‍ය උපයෝගී කරගෙන සටහන් කිරීමේ, වර්ග කිරීමේ, සාරාංශ කිරීමේ හා එම ක්‍රියාදාමයේ ප්‍රතිඵල විවරණය කිරීමේ කලාව ගිණුම්කරණයයි."

- ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරි ආයතනය (The Institute of Chartered Accountants of Sri lanka )

" කිසියම් ආර්ථික සංවිධානයක් සම්බන්ධයෙන් ඇල්ම දක්වන පාර්ශවයන් වෙත තීරණ ගැනීම සඳහා අවශ්‍ය කරන මූල්‍යමය තොරතුරු වාර්තා කරන ක්‍රියාවලිය ගිණුම්කරණයයි. "

ඉහත නිර්වචනයන් අධ්‍යයනය කිරීමෙන් පසු ගිණුම්කරණය යන්න පිළිබඳව පොදු නිර්වචනයක් ඉදිරිපත් කළ හැකිය.


" ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ ඒකකයට අදාළ ආර්ථිකමය තොරතුරු ලබාදීමේ සමස්ථ ක්‍රියාවලිය ගිණුම්කරණයයි. "


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## ගිණුම්කරණයේ අරමුණු

ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ ආර්ථික තොරතුරු සන්නිවේදනය කිරීම ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වේ.

## ගිණුම්කරණ ඒකක





පුද්ගලයෙක්,රජයක්,ව්‍යාපාර සංවිධානයක්,ව්‍යාපාරයක් හෝ ඕනෑම කටයුත්තක් ව්‍යාපාර ඒකකයක් විය හැකිය.


Copyright © e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for The General Education

## තොරතුරු

දැනුම වැඩි කරගැනීමට ඉවහල් වන ඕනෑම දෙයක් තොරතුරු වේ.




( මුදලින් මැනිය හැකි ) ( මුදල් නොවන වෙනත් ඒකක වලින් ප්‍රකාශ කල හැකි )

තීරණ ගැනීම සඳහා ඉහත සියළුම තොරතුරු අදාල වේ.එම තත්ත්වයන් අවබෝධ කර ගැනීම සඳහා පහත තොරතුරු අධ්‍යයනය කරමු.

සාරංග සුපර් සිටි සමාගමේ 2017/03/31 දිනෙන් අවසන් වසර සඳහා පහත තොරතුරු අදාල වේ.

- ව්‍යාපාරික නාමය “සාරංග සුපර් සිටි”
- කාර්ය මණ්ඩලය 25 කි.මින් දෙදෙනකු කළමනාකරුවන් ලෙස කටයුතු කරයි.
- පාරිභෝගික භාණ්ඩ සිල්ලර වෙළඳාමේ යෙදෙන ව්‍යාපාරයකි.
- වර්ෂයේ මුළු විකිණුම් රුපියල් මිලියන 80 වකි.
- වර්ෂයේ මුළු මෙහෙයුම් වියදම් රු.මිලියන 55 කි.
- ප්‍රාග්ධනය ලෙස සාර්ංග රු.මිලියන 50ක වත්කම් ආයෝජනය කර ඇත.
- මුළු ණය රු.මිලියන 30 කි.
- රජයට ගෙවූ VAT රු.මිලියන 5කි.
- සේවක අර්ථ සාධක අරමුදලට (EPF) ගෙවූ දායකය රු.මිලියන 2කි.
- ව්‍යාපාරය විසින් අළෙවිකරණ විදුලි උපකරණ සඳහා වසර 2ක වගකීම් සහතිකයක් නිකුත් කෙරේ.
- කාලච්ඡේදයට අදාල ලාභය මිලියන 20 කි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ඉහත සාරංග සුපර් සිටි සමාගමේ 2017 වර්ෂයට අදාලව දී ඇති තොරතුරු,තොරතුරු වර්ගීකරණයට අනුව පහත ආකාරයට දැක්විය හැක.

| ප්‍රමාණාත්මක තොරතුරු | | ප්‍රමාණාත්මක නොවන තොරතුරු |
|---|---|---|
| මූල්‍යමය | මූල්‍යමය නොවන | |
| • විකුණුම් රු.මිලියන80කි.<br>• වර්ෂයේ මෙහෙයුම් වියදම රු.මිලියන 50 කි.<br>• ප්‍රාග්ධනය රු.මිලියන 50කි.<br>• මුළු ණය රු.මිලියන 30 කි.<br>• රජයට ගෙවූ VAT රු.මිලියන 5කි.<br>• (EPF) ගෙවූ දායකය රු. මිලියන 2කි.<br>• කාලච්ඡේදයේ ලාභය මිලියන 20 කි. | • කාර්ය මණ්ඩලය 25කි.<br>• කළමනාකරුවන් දෙදෙනෙකි.<br>• වගකීම් සහතිකය වසර 2කි. | • සාරංග සුපර් සිටි.<br>• සිල්ලර වෙළඳ ව්‍යාපාරයකි.<br>• වගකීම් සහතිකයක් නිකුත් කෙරේ. |


Copyright © e-thaksalawa.moe.gov.lk

## ආයතනයකට ඇල්මක් දක්වන පාර්ශවයන් හා එසේ ඇල්මක් දැක්වීමට හේතු

| ඇල්මක් දක්වන පාර්ශව | සාරංග සුපර් සිටි ආයතනයේ තොරතුරු | ඇල්මැති පාර්ශව වලට වැදගත් වන ආකාරය |
|---|---|---|
| 1. අයිතිකරු/අයිතිකරුවන්/ ආයෝජකයන් | • ප්‍රාග්ධනය රු.මිලියන 50කි.<br>• කාලච්ඡේදයේ ලාභය මිලියන 20 කි. | • සතුටු දායක ප්‍රතිලාභයක් ලබා තිබේද?<br>• තවදුරටත් ආයෝජනය කරනවාද? |
| 2. කළමනාකරුවන් | • විකුණුම් රු.මිලියන 80කි.<br>• මෙහෙයුම් වියදම් රු.මිලියන 55 කි.<br>• ලාභය රු.මිලියන 20කි. | • සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වේද?<br>• අනාගත වර්ධනය සඳහා තීරණ හා සැලසුම් මොනවාද ? |
| 3. ණය හිමියෝ සහ ණය සපයන ආයතන | • මුළු ණය මිලියන 30නස | • සපයා ඇති ණය වල සුරක්ෂිත තාවය<br>• තවදුරටත් ණය සැපයිය හැකිද ? |
| 4. රාජ්‍ය ආයතන උදා- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | • විකුණුම් මිලියන 80 කි.<br>• ලාභය මිලියන 20කි.<br>• VAT මිලියන 5කි. | • නියමිත පරිදි බදු ගෙවන්නේද?<br>• අවශ්‍ය වාර්තා අදාල ආයතනවලට සපයන්නේද?<br>• ගුණාත්වයෙන් උසස් භාණ්ඩ සාධාරණ මිලට ලබාදෙන්නේ? |
| 5. සේවකයින් | • සේවක අර්ථසාධක අරමුදලට ගෙවූ දායක මිලියන 02කි. | • රැකියාවේ සුරක්ෂිතභාවයක් තිබේද?<br>• නිසි හිමිකම් ලැබෙනවාද? |
| 6. ගණුදෙනු කරුවන් | • වසර 2ක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ අලෙවි කිරීම. | • වගකීම් සහතික වීම් පවත්වාගෙන යන්නේද?<br>• හොද පැවැත්මක් තිබේද? |
| 7. විභව ආයෝජකයින් (අනාගත ආයෝජකයින්) | • ප්‍රාග්ධනය මිලියන 50කි.<br>• ලාභය මිලියන 20කි. | • ආයෝජනය කිරීමට සුදුසු ප්‍රතිලාභ ගෙනදෙන ව්‍යාපාරයක්ද?<br>• ව්‍යාපාර ක්ෂේත්‍රයක් ද? |

අන්තර්ගතය - ඩී.එම්.එස් දිසානායක -කු/මලියදේව.වි -කුරුණෑගල
යූ.බී.ධර්මදාස - අ/තඹුත්තේගම ම.ම.වි- තඹුත්තේගම
යූ.අතුල ඒකනායක -මා /ශාන්ත තෝමස් ජාතික පාසල- මාතලේ
සැකසුම - ඩී.ඒ.ඩී චින්තක උදය කුමාර- ර/ශ්‍රී ඤාණානන්ද ම.වි -කාමරංගාපිටිය,පැල්මඩුල්ල

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk



පයින් ගමන් කරන
ව්‍යාපාරිකයන්

ඇල්මැති
පාර්ශව




රජය හා රාජ්‍ය ආයතන



මෝටර් සයිකල් වලින් පැමිණෙන
කළමනාකරුවන් හා සේවකයන්




ණය හිමියන් හා ණය සැපයුම්
කරුවන්




පැරණි ගොඩනැගිල්ලක
ඇති ව්‍යාපාරයක්

පැරණි
ව්‍යාපාර



ව්‍යාපාර ස්ථානයට පැමිණෙන රාජ්‍ය
නිලධාරීන්




පැරණි ව්‍යාපාර වලට
පැමිනෙන ආකාරය



ණය ගැනීමට පොලිමේ සිටින
අවස්ථාවක්


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk


නවීන ව්‍යාපාරික ස්ථාන

ව්‍යාපාරය දියුණුවට
පත්වී ඇති ආකාරයි


අයිතිකරු රාජ්‍ය ආයතන වෙත
තොරතුරු ලබාදීම


වාහන වලින් පැමිණෙන
කළමනාකරුවන් හා සේවකයන්


ණය හිමියන් හා ණය සපයන
ආයතන ව්‍යාපාරයට පැමිණීම

## ගිණුම්කරණයේ ප්‍රභේද (Branches of Accounting)

ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන් සහ සපයන තොරතුරු වල ස්වාභාවය අනුව ගිණුම්කරණය කොටස් 2කින් යුක්තවේ.

ගිණුම්කරණය

- මූල්‍ය ගිණුම්කරණය (Financial Accounting)
- කළමනාකරණ ගිණුම්කරණය (Management Accounting)

ගිණුම්කරණ ඒකකයක අතීත ගනුදෙනු හා සිද්ධීන් වලට අදාළ තොරතුරු ආර්ථිකයමය තීරණ ගැනීමට සුදුසු වන ආකාරයට සකස් කර අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීම මූල්‍ය ගිණුම්කරණයයි.

ආයතනයක සියළුම කළමනාකරණ මට්ටම් වලට අවශ්‍ය වන පරිදි සැලසුම් කිරීම, පාලනය කිරීම තීරණ ගැනීමට අදාළ වන තොරතුරු සකස්කර ඉතිරිපත් කිරීම කළමනාකරණ ගිණුම්කරණයයි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.l

## මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය
## ( Financial Accounting process)

| යෙදවුම් Input (අමුද්‍රව්‍ය ) | → | ක්‍රියාවලිය (Process) | → | නිමැවුම් Out put ( නිමිභාණ්ඩ ) |
|---|---|---|---|---|

උදාහරණ 1

ලී බඩු නිපදවන ආයතනය

දැව,පොලිෂ් ,ගම්,ඇණ,වීදුරු ,මේස ,අල්මාරි (භාණ්ඩ



දැව කඳන් ඉරීම , සැකසීම ,පොලිෂ් කිරීම නිෂ්පාදනය )



පුටු



උදාහරණ 2

ඇගළුම් නිපදවන ආයතනය

රෙදි , නූල් ,බොත්තම් ,ඇසුරුම් කම්ස ,කලිසම්



රෙදි කැපීම ඇඳුම් මැසීම ,ඇසුරුම් කිරීම



සාරි ,ටී ෂර්ට්




ඉහත ආකාරයටම ගිණුම්කරණයද ක්‍රියාවලියකි.එය පහත දැකවේ.


අන්තර්ගතය - ඩී.එම්.එස් දිසානායක -කු/මලියදේව.වි -කුරුණෑගල
යූ.බී.ධර්මදාස - අ/තඹුත්තේගම ම.ම.වි- තඹුත්තේගම
යූ.අතුල ඒකනායක -මා /ශාන්ත තෝමස් ජාතික පාසල- මාතලේ
සැකසුම - ඩී.ඒ.ඩී චින්තක උදය කුමාර- ර/ශ්‍රී ඥාණානන්ද ම.වි -කාමරංගාපිටිය,පැල්මඩුල්ල

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය




## කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය




අන්තර්ගතය - ඩී.එම්.එස් දිසානායක -කු/මලියදේව.වි -කුරුණෑගල
යූ.බී.ධර්මදාස - අ/තඹුත්තේගම ම.ම.වි- තඹුත්තේගම
යූ.අතුල ඒකනායක -මා /ශාන්ත තෝමස් ජාතික පාසල- මාතලේ
සැකසුම - ඩී.ඒ.ඩී චින්තක උදය කුමාර- ර/ශ්‍රී ඥාණානන්ද ම.වි -කාමරංගාපිටිය,පැල්මඩුල්ල

Copyright © e-thaksalawa.moe.gov.lk

## මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම්

| අසමානතාවයන් | මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණය ගිණුම්කරණය |
|---|---|---|
| 1.සපයන තොරතුරු | ඓතිහාසික | ඓතිහාසික හා පුරෝකතන |
| 2. තොරතුරු පරිහරණය කරන පාර්ශවයන් | අභ්‍යන්තර හා බාහිර | අභ්‍යන්තර |
| 3.තොරතුරු ලබාදෙන කාලය | ගිණුම් කාලච්ඡේදයක් සඳහා | කළමනාකරණ අවශ්‍යතාවය මත |
| 4.නෛතික ස්වාභාවය | ඇත | නැත |


Copyright © e-thaksalawa.moe.gov.lk